දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය - රුහුණ විශ්වවිද්‍යාලය
Distance and Continuing Education Unit – University of Ruhuna

මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය - Faculty of Humanities & Social Sciences

ප්‍රථම ශාස්ත්‍ර (බාහිර) 2018 පරීක්ෂණය (2015 පුනර්) - 2018 සැප්තැම්බර්/ඔක්තෝබර්
First Examination in Arts (External) 2018 (Repeat 2015) – September/October 2018

# දේවිප්‍ර 1.1 - දේශපාලන විද්‍යාවේ මූලධර්ම
# PS 1.1 – Elements of Political Science

කාලය පැය තුන යි

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න
පැහැදිලි අත් අකුරින් පිළිතුරු සැපයිය යුතු ය.

---

01. "දේශපාලනය විධිමත්ව අධ්‍යයනය කිරීම දේශපාලන විද්‍යාවයි." වර්තමානයේ එහි ඇති වැදගත්කම කෙරෙහි අවධානය යොමු කරමින් මෙම ප්‍රකාශය සාකච්ඡා කරන්න.

02. තුලනාත්මක අධ්‍යයන ප්‍රවේශයේ ප්‍රධාන සලකා බැලීම් මොනවා දැයි විස්තර කොට එහි වාසි අවාසි පෙන්වා දෙන්න.

03. "රාජ්‍යය" නිර්වචනය කොට එහි අත්‍යාවශ්‍ය අංග ලක්ෂණ නිදසුන් ඇසුරින් විග්‍රහ කරන්න.

04. රාජ්‍යය පිළිබඳ මාක්ස්වාදී මතය විශ්ලේෂණය කරන්න.

05. (අ) නියෝජනයේ ප්‍රධාන ආකාර මොනවා ද?

(ආ) සරල බහුතර නියෝජන ක්‍රමයේ වාසි සහ අවාසි නිදසුන් සහිතව පෙන්වා දෙන්න.

06. "බලතල පංගු කිරීමේ සිද්ධාන්තය ප්‍රායෝගිකව ක්‍රියාවට නැංවීම අවශ්‍යව ඇත්තේ අතීතයට වඩා වර්තමානයේ ය." ඔබ එකඟ වන්නේ ද? හේතු දක්වන්න.

07. පහත සඳහන් ඕනෑම දෙකක් විභාග කරන්න.
(අ) නීතියේ ආධිපත්‍යය (Rule of Law)
(ආ) ව්‍යවස්ථානුකූලවාදය (Constitutionalism)
(ඇ) අධිකරණයේ ස්වාධීනත්වය (Independence of Judiciary)

08. ඇමරිකා එක්සත් ජනපදයේ හෝ වත්මන් ශ්‍රී ලංකාවේ ජනාධිපති තෝරා පත්කර ගැනීමේ හා තනතුරින් ඉවත් කිරීමේ ක්‍රමවේදය විශ්ලේෂණය කරන්න.

09. මූලික අයිතිවාසිකම් නිර්වචනය කොට නූතන ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රමයන්හි පුරවැසි අයිතීන් සුරක්ෂිත කිරීම සඳහා ගෙන ඇති විධිවිධාන නිදසුන් සහිතව පෙන්වා දෙන්න.

10. පහත සඳහන් ඕනෑම දෙකක් විශ්ලේෂණය කරන්න.

(අ) රාජ්‍යය සහ සිවිල් සමාජය

(ආ) සන්ධීය ආණ්ඩුක්‍රමයක මනා ක්‍රියාකාරිත්වය උදෙසා අවශ්‍ය කොන්දේසි

(ඇ) ශ්‍රී ලංකාවේ දේශපාලන පක්ෂ ක්‍රමය

(ඈ) ශ්‍රී ලංකාවේ වෘත්තීය සමිතිවල ක්‍රියාකාරිත්වය